## අ.පො.ස. උසස් පෙළ විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව විසින් සැලසුම් කොට පිළියෙළ කරන ලද අ.පො.ස. උසස් පෙළ විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය, අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින දිවයිනේ සියළු සිසුන් උදෙසා සකස් කරන ලද ඉගෙණුම් උපකරණ කට්ටලයකි.

කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අ.පො.ස. උසස් පෙළ විභාගයට 2022 වර්ෂයේ දී පෙනී සිටීමට නියමිතව සිටි සිසුන්ගේ අඛණ්ඩ අධ්‍යාපනයට එල්ල වූ බාධා සමනය කිරීමේ අදහසින් ප්‍රතිකාර්ය වැඩසටහනක් ලෙස සැලසුම් කළ මෙම පුනරීක්ෂණ සංචිතය, අ.පො.ස. උසස් පෙළ ගිණුම්කරණ විෂය නිර්දේශයේ සියළු නිපුනතා ආවරණය වන පරිදි සකස් කර ඇත.

ඒ අනුව, නිපුනතා අංක 01 සිට 16 දක්වා සියළු පාඩම් ආවරණය කරන ලද ගිණුම්කරණ පුනරීක්ෂණ අභ්‍යාස සරල මට්ටමේ සිට සංකීර්ණ මට්ටම දක්වා බහුවරණ, කෙටි සහ ව්‍යුහගත ප්‍රශ්න සහ පිළිතුරු සහිතව මෙහි ඇතුළත් කර ඇත.

මෙම පුනරීක්ෂණ සංචිතය විධිමත්ව පරිශීලනය කොට ක්‍රමාණුකූලව අභ්‍යාස කිරීම මඟින් සිසුන්ට මඟ හැරුණු සියළු පාඩම් කොටස් ඵලදායී ආකාරයෙන් සාධනය කර ගැනීමටත්, නිරතුරු අභ්‍යාස කිරීම මඟින් ඉහළ සාධන මට්ටමක් කරා ලඟා වීමටත් සිසුන්ට අවකාශ සැලසෙනු ඇතැයි අපේක්ෂා කරමු.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව